# 1

# ගුවන්විදුලි මාධ්‍යවේදයේ ඓතිහාසික සංකල්පීය පරිණාමය සහ 21 වන සියවසේ සුසමාදර්ශීය විතැන්වීම

විශුඩර් වීරසිංහ

සංහතික මාධ්‍යවේදය පිළිබඳ දෘෂ්ටිමය න්‍යායික සංකල්ප බිහිවීමේ සහ ඒවායේ පරිණාමය සංහතික මාධ්‍ය පද්ධති බිහිවීමේ සහ ඒවායේ ඓතිහාසික ක්‍රියාකාරිත්වයන් සමග වෙන් කළ නොහැකි ලෙස සම්බන්ධව පවතී. විශේෂයෙන් 17 සහ 18 වැනි සියවස්වල පුවත්පත් සහ සගරා ඇතුළු වාර ප්‍රකාශනවල වර්ධනය හේතුකොට ගෙන ඒවා සමාජ ජීවිතයට මෙන්ම සදාචාරාත්මක සහ ආධ්‍යාත්මික ක්ෂේත්‍රවලට සිදුකරන ලද බලපෑම කේන්ද්‍රගතව දියත් වූ සංකතිකාව අද්‍යතනයේද ලොව පුරා විවිධ ස්වරූපයෙන් සහ විවිධ තල ඔස්සේ සිදුවෙමින් පවතී. එම ඓතිහාසික කතිකාවේ මූලික පැතිකඩ ලෙස මාධ්‍ය දේශපාලන බලයට දක්වන සම්බන්ධතාව, මාධ්‍ය සහ රාජ්‍ය අතර සම්බන්ධතාව, මාධ්‍ය සහ සමාජය, පෞද්ගලික ජීවිතය ආදී ක්ෂේත්‍ර අතර සම්බන්ධතා ඉතා වැදගත් වූ බව පෙනේ. මෙම ඓතිහාසික සංකතිකාවේ කොටස්කරුවන් වූයේ මාධ්‍යවේදීන් පමණක් නොවේ. දාර්ශනිකයන්, දේශපාලන විද්‍යාඥයන්, සමාජ විද්‍යාඥයන්, මනෝ විද්‍යාඥයන්, නීතිවේදීන්, සදාචාරවාදීන් ආදීන් විසින් මේ නව සමාජ ආයතනයක් ලෙස වර්ධනය වන්නා වූ ප්‍රපංචය අධ්‍යයනය කරන ලදී. විශේෂයෙන් සඳහන් කළ යුත්තක් වන්නේ සංහතික මාධ්‍යයේ ක්‍රියාකාරිත්වය වර්ධනයට සමාන්තරව සංහතික මාධ්‍ය පිළිබඳ විවිධ දෘෂ්ටිමය න්‍යායික සංකල්ප හැඩගැසීමද සිදුවිය. එම වර්ධනය වූ දෘෂ්ටිමය න්‍යායික සංකල්පීය ප්‍රවණතා තුළ අප ඉහත පෙන්වා දුන් ගැටලු නිරාකරණයට ලක් වූයේය. මෙම ලිපියේ මූලික අරමුණ වන්නේ සංකල්පවලින් සමකාලීන සංහතික මාධ්‍ය පද්ධති සකස්වීම කෙරෙහි බලපාන ලද විශේෂයෙන් ගුවන්විදුලි සංහතික මාධ්‍යයට අදාළව ප්‍රධාන දෘෂ්ටිමය න්‍යායික සංකල්ප ප්‍රවණතා කීපයක් විමසා බැලීමය.

ඓතිහාසික වශයෙන් සංහතික සන්නිවේදන මාධ්‍යයන්ගේ වර්ධනය සහ ඒවා සමාජය තුළ පැතිරීම කෙරෙහි පුද්ගල අයිතිවාසිකම් සහ නිදහස පිළිබඳ අදහස්ද සැලකිය යුතු බලපෑමක් සිදුකර ඇති බව පෙන්වා දිය යුතුය. පුද්ගලයා සමාජය රාජ්‍ය අතර සම්බන්ධතා විග්‍රහ කිරීම කෙරෙහි යොමුවී තිබූ ලිබරල්වාදී චින්තනය, දෘෂ්ටිවාදය එහිදී වැදගත් සාධකයක් විය. පුද්ගල අයිතිවාසිකම් සහ නිදහස පිළිබඳ ප්‍රධාන මූලධර්ම කීපයක් පවතින අතර, සමාජය තුළ කාර්යක්ෂම, සවිඥානික සහ දැනුවත් පුරවැසියන් ආණ්ඩුවේ සහ රාජ්‍යයේ දේශපාලන ක්‍රියාවලියට සහභාගි වන සහ අදාළ දේශපාලන තීරණ පිළිබඳ පූර්ණ අවබෝධයක් සහිත පුද්ගලයන් සිටිය යුතු ය. මේ සඳහා සමාජය තුළ අදාළ සංහතික (mass) සන්නිවේදන සහ මහජන (public) තොරතුරු කොන්දේසි තිබිය යුතුය. සමාජය සහ දේශපාලන ප්‍රශ්න පිළිබඳ පුරවැසි මතය, ජනමතය ප්‍රකාශ කිරීම අවශ්‍ය වන්නේය. ලිබරල්වාදී සන්දර්භය තුළ සංහතික මාධ්‍ය සන්නිවේදනයේ භූමිකාව අවබෝධකර ගැනීමේ කේන්ද්‍රීය ලක්ෂණය වන්නේ පුරවැසි අයිතිවාසිකම්, නිදහස සහ හිමිකම් ආණ්ඩුවෙන් සහ රාජ්‍යයෙන් ආරක්ෂා කර ගැනීමේ අවශ්‍යතාවය යි. මෙහිදී භාෂණයේ, ප්‍රකාශනයේ සහ සංහතික මාධ්‍ය නිදහස සහතික කිරීම සහ තහවුරු කිරීම මෙම සංකල්පයේ මුල්ගල වන්නේය. මේ සම්බන්ධව 17-19 වැනි සියවස් කාලපරිච්ඡේද තුළ බිහිවී වසර වර්ධනය වූ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී අදහස් වැදගත් කාර්යභාරයක් සිදු කළ අතර, එය පුද්ගල, පුරවැසි අයිතිවාසිකම්, නිදහස ලැදියාවන් රාජ්‍ය බල දණ්ඩනයෙන් ආරක්ෂා කිරීම සඳහා යොමුව තිබිණ.

සංහතික මාධ්‍ය සන්නිවේදන නිදහස සංකල්පයේ නිර්මාණය කිරීම සහ වර්ධනය කිරීම සඳහා ජෝන් මිල්ටන් (John Milton 1608-1674), ජෝන් ලොක් (John Locke 1632-1704), ජෙරෙමි බෙන්තම් (Jeremy

Bentham 1748-1832), සහ ජෝන් ස්ටුවර්ට් මිල් (John Stuart Mill 1806-1873) යන අයගේ අදහස් ඉතා වැදගත් විය. පුද්ගලයාගේ බුද්ධිමත්කම සහ ස්වාධීන චින්තනය පිළිබඳ ජෝන් මිල්ටන්ගේ දේවධර්මවාදී සංකල්පයද, පුද්ගලයාගේ ස්වාභාවික අයිතිවාසිකම් පිළිබඳ ජෝන් ලොක්ගේ දේශපාලන දාර්ශනික සංකල්පයද, නිදහස් මාධ්‍ය රටවැසියාගේ සෞභාග්‍ය උපරිම කිරීමේ උපකරණයක්ය යන ජෙරෙමි බෙන්තම්ගේ සංකල්පයද, නිදහස් අදහස් වෙළඳපොළ පුද්ගලයාට සත්‍ය දැනගැනීම සඳහා අවශ්‍ය මූලික යන්ත්‍රයක්ය යන ජෝන් ස්ටුවර්ට් මිල්ගේ සංකල්පයද, සමකාලීන ගුවන්විදුලි මාධ්‍ය ඇතුළු සංහතික මාධ්‍යයන් පිළිබඳ දෘෂ්ටිමය න්‍යායික සංකල්ප ප්‍රවණතා හැඩගැස්වීම කෙරෙහි තීරණාත්මක බලපෑමක් සිදුකොට ඇති බව සඳහන් කළ යුතුය.

මේ අප ඉහත ගෙනහැර දක්වන ලද සියලු අදහස් සමස්තයක් ලෙස ගෙන එමගින් සංහතික සන්නිවේදන මාධ්‍යවේදය පිළිබඳ මානවවාදී ප්‍රජාතාන්ත්‍රික සංකල්පය ගොඩනගා ගත හැකිය. මෙම ප්‍රවණතාව නියෝජනය කරන සංහතික සන්නිවේදන මාධ්‍යවේදයේ සහ ඊට අදාළ මාධ්‍යකරුවන්ගේ මූලික හරය වන්නේ මාධ්‍යයේ සහ මාධ්‍යවේදීන්ගේ සියලු ශාක්‍යතාවල බුද්ධිය, දැනුම සහ හැකියාව ජනතාව වෙනුවෙන් යෙදවීමයි. මෙම මාධ්‍යවේදීහු සමාජයෙහි ආධිපත්‍ය දරන, ජනතාව පීඩනයට පත් කරන, සියලු අධිපතිවාදී සහ වහල් ස්වරූපවලට එරෙහිව සටන් කළහ. මෙම මාධ්‍යවේදීහු ජනතාවට ආදරය කළහ. ජනතාව විශ්වාස කළහ. ඔවුහු ජනතාවගේ ඉරණමේ කොටසක් බවට පත්වූහ.

මානවවාදී ප්‍රජාතාන්ත්‍රික සංහතික මාධ්‍ය ප්‍රවණතාව අප ගෙන හැර දක්වූ ඉතිහාසයට පමණක් අදාළ මාදිලියක් පමණක් නොව අද්‍යතන සමාජයෙහි ගුවන්විදුලි සංහතික සන්නිවේදනය ඇතුළු සෙසු මාධ්‍යවල ප්‍රමුඛ ප්‍රවණතාව බවට පත්ව ඇති වාණිජකරණය, සංහතීකකරණය, නිශ්සාරකරණය, හරසුන්කරණය සහ නිර්සන්නිවේදනීය සන්දර්භය තුළද යම් ප්‍රමාණයකට හෝ සක්‍රියව පවතින බව පෙන්වා දිය යුතුය. 18 වැනි සියවසේ සංහතික මාධ්‍ය දාර්ශනික සහ ගැඹුරු සමාජ ඉගැන්වීම්වලින් ප්‍රබල ආභාසයක් ලැබූ නමුත් අද්‍යතන සංහතික සන්නිවේදන මාධ්‍යවේදයට ඒ තත්වය අහිමි වී තිබේ.

සංහතික සන්නිවේදන මාධ්‍යය නව මානයක් ඔස්සේ අවබෝධකර ගැනීම සඳහාත් එය සමාජ දේශපාලන අරගලයේ දෘෂ්ටිවාදී මෙවලමක් ලෙස යොදා ගැනීම සඳහාත් ක්‍රමවේදී පදනම් නිර්මාණය කරන ලද සංහතික සන්නිවේදන මාධ්‍ය පිළිබඳ දෘෂ්ටිමය න්‍යායික ප්‍රවණතා අතර දෙවන ප්‍රවණතාව ලෙස මාක්ස්වාදී ප්‍රවණතාව සැලකිය හැකිය. සමාජ පන්ති ප්‍රතිවිරෝධතා වර්ධනය වූ සන්දර්භය තුළ මාක්ස්වාදී න්‍යාය බිහිවිය. ඓතිහාසික දෘෂ්ටිකෝණයට අනුව සංහතික සන්නිවේදන මාධ්‍ය පිළිබඳ මාක්ස්වාදී සංකල්පය යනු විප්ලවීය ප්‍රජාතන්ත්‍රවාදී සංහතික සන්නිවේදන සංකල්පයේම ඉදිරි වර්ධනයකි. සමතයකට පත් කළ නොහැකි පන්ති අරගලය පිළිබඳ සංකල්පය මාක්ස්වාදී සංහතික සන්නිවේදන න්‍යායේ කේන්ද්‍රීය ලක්ෂය වේ. පළල් සහ ගැඹුරු දෘෂ්ටි කෝණයෙන් සලකා බලන විට සංහතික මාධ්‍යවේදියාගේ ක්‍රියාකාරිත්වය සමාජ දේශපාලනික හරයන් දරන බව මාක්ස්වාදය අවධාරණය කරයි. සංහතික මාධ්‍ය පිළිබඳ මාක්ස්වාදී සංකල්පය සමාජයෙහි පන්ති විඥානය ශක්තිමත් කිරීම සඳහාත් සාමූහික සහ සමාජ විඥානය ප්‍රවර්ධනය කිරීම සඳහාත් සුවිශාල මෙහෙවරක් ඉටු කළේය. පුවත්පත සාමූහික ප්‍රචාරකයෙකු සහ සාමූහික උද්ඝෝෂකයෙකු පමණක් නොව සාමූහික සංවිධායකයෙකු බව ලෙනින් අවධාරණය කළේය.

ඉහත අපගේ විග්‍රහයට භාජනය වූ සංහතික සන්නිවේදනය පිළිබඳ මානවවාදී ප්‍රජාතාන්ත්‍රික සංකල්පය සහ සංහතික සන්නිවේදනය පිළිබඳ මාක්ස්වාදී සංකල්පය මූලික වශයෙන් සමාජ දේශපාලනික සහ දෘෂ්ටිවාදී නැඹුරුවක් සහ හරයක් ගන්නා බව සඳහන් කළ යුතුය. 19 වන සියවස අගභාගය වන විට මානව සමාජ පරිණාමයේ සුවිශේෂ විපරිවර්තනයන් සිදු වූ අතර, මානව සමාජ ජීවිතය තුළ ධනේශ්වර සම්බන්ධතා සහ වටිනාකම් වර්ධනය වූවා පමණක් නොව, ඒවා සමාජ ජීවිතයෙහි දෛනික ආධිපත්‍යයක ස්වරූප බවට පත් විය. මේ නව සන්දර්භය තුළ අලුත් මාධ්‍ය සන්නිවේදන සංකල්ප වර්ධනයට අවශ්‍ය පදනම නිර්මාණය වන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙස මාධ්‍ය හා සන්නිවේදනය සම්බන්ධ සංහතික සන්නිවේදනාත්මක සංකල්ප (Mass Communication Concept) හැඩ ගැසෙන්නට විය. විශේෂයෙන් පොක්බරය (සෙනග) සංහතික යන අලුත් සමාජ ප්‍රපංච පිළිබඳ අධ්‍යයනයන් ආරම්භ වන්නට වූ අතර ගුස්ටෙව් ලේබන් (Gustave Le Bon 1841 - 1931)

සහ ගබ්රියල් ටර්ඩ් (Gabriel Trade) සංහතික ප්‍රපංච අධ්‍යයනයේ පුරෝගාමීහු වූහ. මෙම අලුත් න්‍යායන්වල පදනම බවට පත් වූයේ ආර්ථික, දේශපාලන හෝ දෘෂ්ටිවාදය නොව මනෝ විද්‍යාව, සමාජ විද්‍යාව, තාක්ෂණික සහ තාක්ෂණවේදී පද්ධති බව විශේෂයෙන් සඳහන් කළ යුතුය. පුද්ගලයන් එය වාර්ගික, ජාතික, සාමාජීය, සංස්කෘතික, ආගමික, වෘත්තීය ආදී සාධක මත රඳා පවතින්නේ නැතිව ඍජු ලෙස අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වයේ යෙදීම නිසා බිහිවන සාමාජීය ප්‍රපංචයක් ලෙස ලේබන් සංහතිකත්වය අර්ථකථනය කළේය. පොත්බරය මනුෂ්‍ය වර්ගයාගේ ඉතිහාසයෙහි පවුල් සංස්ථාවෙන් පසුව බිහි වූ සමාජ කණ්ඩායම් අතර පැරණිතම කණ්ඩායමක් බව සංහතික සමාජ විද්‍යාවේ පුරෝගාමියෙකු වූ ගබ්රියෙල් ටර්ඩ් පෙන්වා දුන්නේය. ටර්ඩට අනුව පොත් ප්‍රකාශනයේ ආරම්භයත් සමග මානව වර්ගයා සිය පරිණාමයේ නව යුගයකට අවතීර්ණ වූ අතර, පොත්බරයේ වන ප්‍රභේදයක් ලෙස මහ ජනතාව බිහි විය.

මහජනතාව යනු කායිකව විසිරී සිටින නමුත් බුද්ධිමය සම්බන්ධතා මගින් ඒකාබද්ධව සිටින පුද්ගලයන්ගේ ආධ්‍යාත්මික පොදුභාව යැයි "මහජන" (Public) යන සංකල්පය මුලින්ම විද්‍යාත්මක ව්‍යවහාරයට එක් කරන ලද්දේ ද ටර්ඩ් විසිනි. මහජන ප්‍රපංචය, මානව සමාජය දීර්ඝ කාලීනව ස්ථාපිත වීමේ ප්‍රතිඵලයක් වන අතර බුද්ධිමය සහ සන්නිවේදනාත්මක සම්බන්ධතා, විශේෂයෙන් දැනුම ව්‍යාප්තිකරණය සමග නිර්මාණය වන සමාජ ප්‍රපංචයකි. සමස්තයක් ලෙස පූර්ව නූතන යුගයේ පැවති සාම්ප්‍රදායික සමාජය (ජන සමාජය) බිඳ වැටී නූතන සමාජය (සංහතික සමාජය) බිහි විය. සංහතිකයන් යනු විවිධ පාන්තික කොටස්වලින් සමාජ ස්තරවලින් සහ කණ්ඩායම්වලින් සැදුම් ලත් විවිධ පුද්ගලයන්ගේ විශාල ප්‍රමාණයකි. කාර්මික වර්ධනය, ආර්ථික සම්බන්ධතා, නාගරික ජීවන මාදිලිය, ග්‍රාමීය ජනතාව නගරවලට ආගමනය, විද්‍යා තාක්ෂණික ප්‍රගතිය, ජන සංඛ්‍යාව වර්ධනය වීම ආදියට සමාන්තරව ගොවීන් සහ හස්ත කාර්මිකයන්ගෙන් සමන්විත සමාජයෙහි වූ සමජාතිකභාවය, ඒකාබද්ධතාව සහ සාමූහිකත්වය බිඳ වැටීම හේතු කොට ගෙන සමාජධුරාවලියේ විවිධ තල නියෝජනය කරන නිදහස් පුද්ගලයන් සුවිශාල ප්‍රමාණයකින් සැදුම්ලත් ජන සමාජයට වඩා ගුණාත්මක වශයෙන් වෙනස් තත්ත්වයකි. මේ තත්ත්වයන් මත සංහතික සන්නිවේදනාත්මක න්‍යායන් හැඩගැසෙන්නට වූ අතර, ඒවා සංහතික සමාජයේ මූලික ගති ලක්ෂණ ප්‍රකට කරන්නේය. නිෂ්පාදනය සංහතිකකරණය වීම, නිෂ්පාදනය ප්‍රමිතකරණය වීම, ශ්‍රම විභජනය, මිනිසුන් අතර ජීවමාන සහ සජීවි සම්බන්ධතා බිඳ වැටීම, මිනිස් අවශ්‍යතා ළැදියා සහ රසඥතා සාමාන්‍යකරණය වීම හා සමජාතිකරණය වීම මෙන්ම ඒවා ප්‍රාථමිකකරණය වීම සංහතික සමාජයෙහි ගති ලක්ෂණ අතර ප්‍රමුඛ වන අතර ඒවා සංහතික විඥාපනික තොරතුරු සහ සන්නිවේදන ක්ෂේත්‍රය තුළ වඩාත් කැපී පෙනෙන සහ පොදු ප්‍රපංච බවට පත් වන අතර, අද්‍යතන ගුවන්විදුලි සන්නිවේදනය මේ සඳහා නිදර්ශන ලෙස දැක්විය හැකිය. මේ තත්ත්වය එක් අතකින් මිනිසුන් අතර පුද්ගලාන්තර අන්තර්පුද්ගල සන්නිවේදන, ඍජු සහ සජීවි සමාශ්‍ර ස්වරූප හීනවීමද, පුද්ගලාන්තර හුදෙකලා භාවයද, පුද්ගලයාන ප්‍රවණතා ප්‍රබල වන අතර, අනෙක් අතින් මේ තත්වය තුළ සංහතික ප්‍රපංච සහ සංහතීකකරණ ගතික සහ ප්‍රවණතා වර්ධනය වන්නට වන අතර, මෙතෙක් කල් සාම්ප්‍රදායික සමාජයෙහි වූ තොරතුරු නිෂ්පාදනය, හුවමාරුව, සම්ප්‍රේෂණය සහ පරිභෝජනය තාක්ෂණික සහ තාක්ෂණිකවේදී පද්ධති ඔස්සේ සිදුවී නම් අලුත් මාදිලියකට මානව සමාජය ගමන් කරන්නේය. ඒ අනුව සමාජයේ පුද්ගලයන් අතර මෙන්ම විවිධ සමාජ පාර්ශ්ව අතර වක්‍රීය තාක්ෂණික සම්බන්ධතා මාර්ග භාවිතය සක්‍රීය වන්නේය. සමාජයෙහි විවිධ සංඝටක සමස්තික ඒකීය ව්‍යුහයක් තුළට ඒකාග්‍ර කිරීමේ ප්‍රධානම යන්ත්‍රණය සංහතික මාධ්‍ය වන්නේය (Fluer, 1970). සංහතික සන්නිවේදන මාධ්‍ය එම ඒකාග්‍රතාව ළඟා කර ගන්නේ සමාජයෙහි විවිධ අවශ්‍යතා, ළැදියා මත ඒකීයකරණය කිරීමේ මාර්ගයෙනි.

විශේෂයෙන් සංහතික සංස්කෘතිය සහ සංහතික ප්‍රචාරණය පිළිබඳ අවිවේචකවාදී (අවිඥානික) සංකල්ප 19 වැනි සියවස තුළ වර්ධනය වූ අතර එම සංකල්පයේ න්‍යායික සහ දාර්ශනික පදනම පාදක කොට ගෙන සංහතික මාධ්‍යයේ ප්‍රභේද, (ශානරය) ව්‍යුහය සහ එහි අන්තර්ගතය ප්‍රතිසංස්කරණය කරමින් එමගින් සැබෑ මහජන ග්‍රාහකත්වයට, මහජන විඥානයට හුදු දෘෂ්ටිවාදී, ප්‍රචාරණාත්මක, මිථ්‍යාමය සහ ප්‍රබන්ධමය අදහස් ඇතුළත් කිරීමේ යුගයක ආරම්භ වූ අතර, ඇමරිකා එක්සත් ජනපදය ඇතුළු යුරෝපයෙහි 20 වැනි සියවස තුළ මෙම ප්‍රවණතාව ආධිපත්‍යවාදී ධාරාවක්, ප්‍රවාහයක් බවට පත්වූ බව නිරීක්ෂණය කළ හැකිය. සංහතික

සන්නිවේදන මාධ්‍ය යනු සංහතිකයන්ට මිථ්‍යා, බොරු, අසත්‍ය තොරතුරු මහ පරිමාණයෙන් ප්‍රචාරය කිරීමට සහ ඒවා සංහතික විඥානය තුළට ආරෝපණය කිරීමට, කාවැද්දීමට ඇතිවුමල යාන්ත්‍රණයක් බව තහවුරු විය. සංහතික මාධ්‍ය ප්‍රචාරක ප්‍රවණතාව ගවේෂණය කිරීමේ කටයුත්ත තවත් අතකින් නිශ්චයාත්මක සංකල්පීය නොයා ගැනීම් ඔස්සේ සිදු විය. සවිඥානික පෞරුෂත්වය අතුරුදහන් වීම සංහතිකාරෝපණය, සංහතිකයන්ට ඇතුළත් කරන ලද අදහස් ක්ෂණිකව ක්‍රියා කිරීමේ හැකියාව ආදිය ඊට අයත් විය. 19 වැනි සියවස අග සහ 20 වැනි සියවස මුලදී සංහතික මාධ්‍යවල මෙහෙයවීමේ සහ ප්‍රචාරණාත්මක ක්‍රියාකාරීත්වය පිළිබඳ ප්‍රමුඛ සමාජ විද්‍යාඥයෝ සිය සුවිශේෂ අවධානය යොමු කළහ. සමාජය මඟින් සකස්කොට පුද්ගල විඥානයට ඇතුළත් කරන ප්‍රමිතීන් මිනිසුන්ගේ චර්යාවේ පදනමේ වන අභිප්‍රායන් වන බව බොහෝ සමාජ විද්‍යාඥයෝ නිගමනය කළහ. එහි ප්‍රතිඵලයක් ලෙස සමාජ විද්‍යාව තුළ සමාජ පීඩනය සහ බලහත්කාරය පිළිබඳ සංකල්පය වර්ධනය විය. තාර්කික, විද්‍යාත්මක, සත්‍යවාදී, දැනුමත් පාරිභෝතික, ව්‍යාජ දැනුමත් අතර වෙනස මත පැරේටෝ සිය දෘෂ්ටිවාදය පිළිබඳ සංකල්පය ඉදිරිපත් කළ අතර, දෘෂ්ටිවාදය අවිවේචකවාදී බව, අවිඥානික බව ඔප්පු කරන පැරේටෝ තනි තනි පුද්ගලයන් සිය සම්ප්‍රදායන් හුරුපුරුදු හැඟීම් සහ ඉව මත පදනම්ව සමාජ ක්‍රියාවලීන් පිළිබඳ අතාර්කික වැටහීම්වලට පැමිණෙන බව පෙන්වා දෙයි.

20 වැනි සියවස තුළ මෙම ප්‍රවණතාව ඇමරිකා එක්සත් ජනපදය ඇතුළු බටහිර යුරෝපීය රටවල ආධිපත්‍යවාදී තත්වයකට පත් වූ අතර, ඒ සම්බන්ධව ඉදිරි ගවේෂණ කටයුතු විවිධ පුද්ගලයන් විසින් සිදුකරන ලද බව පෙනේ. ඒ අනුව දේශපාලන අරමුණු ඉටු කර ගැනීම සඳහා මහජන මතය හැඩගස්වා ගැනීමේ යාන්ත්‍රණය අධ්‍යයනය කිරීම පිළිබඳ වොල්ටර් ලිප්මාන්ගේ අධ්‍යයනද එසේම සංහතික සන්නිවේදන ක්‍රියාවලිය තුළ තොරතුරුවල ප්‍රගමනයේ ව්‍යූහීය සැකැස්මේ න්‍යායික පදනම ගොඩනැඟීම සම්බන්ධ හැරල්ඩ් ලැස්වෙල්ගේ දායකත්වයද, ඊට අමතරව සමාජය තුළ දේශපාලන මනෝභාවය කෙරෙහි සංහතික මාධ්‍යයේ බලපෑම අධ්‍යයනය කිරීම පිළිබඳ අන්තර්ගත විශ්ලේෂණය සම්බන්ධ පෝල් ලාසාස්ෆෙල්ඩ්ගේ අධ්‍යයනද අවසාන වශයෙන් සංහතික සන්නිවේදනය සමාජ ජීවිතයේ සහ ආධ්‍යාත්මික ජීවිතයේ සියලුම ක්ෂේත්‍රවලට පාදක වන්නා වූද සමාජයේ සහ ඉතිහාසයේ ගමන් මග තීරණය කරන්නා වූද, සුවිශේෂ සංස්කෘතික සහ තාක්ෂණික සංකීර්ණයක් ලෙස සංකල්පගත කළ මාෂල් මැක්ලුහන්ගේ "මාධ්‍යයම සන්දේශය වේ" ගොඩනැඟීමද ආදිය ගෙන හැර දැක්විය හැකි ය.

අද්‍යතන සංහතික මාධ්‍ය ක්‍රියාකාරීත්වය මාධ්‍ය න්‍යායන්ගෙන් තොරව අවබෝධ කරගත හැකි නොවේ. විශේෂයෙන් ගුවන්විදුලි සන්නිවේදන මාධ්‍ය සංහතික සන්නිවේදන පද්ධතියේ අවියෝජනීය කොටසක් ලෙස අද්‍යතන තොරතුරු සන්නිවේදන මාධ්‍ය පද්ධතිය අතර එම භූමිකාව සුවිශේෂිතාව වටහා ගැනීම සඳහා ඒ පිළිබඳ න්‍යායික සංකල්පනය අත්‍යවශ්‍ය වේ.

සමකාලීන සංහතික මාධ්‍ය න්‍යායේ පුරෝගාමියා (පියා) ලෙස වොල්ටර් බෙන්ජමින් (Walter Benjamin) සලකනු ලබන අතර විශේෂයෙන් ගුවන්විදුලි මාධ්‍ය සන්නිවේදනය ආශ්‍රිතව ඔහුගේ මූලාකෘතික සමකාලීන සංහතික මාධ්‍ය න්‍යාය ගොඩනගා තිබීම විශේෂත්වයකි. 1920 ගණන් අග භාගයේ වොල්ටර් බෙන්ජමින් මොස්කව් සංචාරය අතරතුර සර්ජි ත්‍රිතියා කොව්ගේ කෘතිද වර්ටෝව්ගේ ප්‍රචෝවිකින්ගේ LEF සඟරාවේ පළ වූ ශාස්ත්‍රීය ලිපි පරිශීලනයන් සිදු විය. 1930 ගණන්වලදී බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්ගේ ගුවන්විදුලි න්‍යාය පිළිබඳ බෙන්ජමින්ට ගැඹුරින් අධ්‍යයනය කිරීමට අවස්ථාව උදා වූ අතර, එහිදී ඔහු සිය ප්‍රථම මාධ්‍ය න්‍යාය තීනි කිරීම සඳහා බ්‍රෙෂ්ට්ගේ ගුවන්විදුලි න්‍යාය සහ නාට්‍ය පෙළ රචනයේ ආභාසය ලබා ගත්තේය. කෙසේ නමුත් සමාජවාදී විප්ලවයේදී කලා නිර්මාණවල මාධ්‍යයන්ගේ වෙනස් වීම සහ ලේඛන ශිල්පීය ක්‍රම වෙනස් වීම පිළිබඳ මාක්ස්වාදී ආභාසය ප්‍රතිබිම්භනයකට ලක් කළේ ය. බෙන්ජමින්ට අනුව කලාකරුවාගේ කාර්යය වන්නේ කලාත්මක ශ්‍රමයේ නිෂ්පාදන තුළ වාමාංශික අදහස් ප්‍රකාශ කිරීම පමණක් නොව, කලාකරුවාට සමීප නිෂ්පාදන මාධ්‍යයන් නිර්ධන පාන්තික හැඩුරුවකට ධනේශ්වර සමාජ තත්ත්වයන් යටතේ දී පවා සිදු කිරීමයි. කලාකරුවා මෙම අරමුණ සඳහා ඡායාරූපය, සිනමාව, ගුවන්විදුලිය සහ සංහතික ප්‍රචාන්තිකරණය ඇතුළු අලුත් මාධ්‍ය භාවිත කළ යුතු බව බෙන්ජමින් අවධාරණය කළේය. සංහතික මාධ්‍ය සන්දේශය තුළ වැදගත් වූද, නරවත් වූද,

ගැඹුරු වූද, විප්ලවීය හරයක් දරන අර්ථ, අදහස් මායාකාර, ඉන්ද්‍රජාලික ස්වරූප බවට පත් නොවීම සහ පවත්නා වූ සමාජ සම්බන්ධතා සෞන්දර්යකරණයෙන් වළක්වා ගැනීම සඳහා මාධ්‍යවේදීන් ක්‍රියා කළ යුතු බව බෙන්ජමින් පෙන්වා දුන්නේ ය. බෙන්ජමින් ජර්මානු ගුවන්විදුලිය සඳහා නව වැඩසටහනක ආකෘතියක් නිර්මාණය කිරීමේ අරමුණින් 1920-1930 අතර ආරම්භක සෝවියට් කලාවේ සහ සාහිත්‍යයේ ලිපි ලේඛන විමසීමට ලක් කළේ ය.

අපට වෝල්ටර් බෙන්ජමින් වැදගත් වන්නේ ගුවන්විදුලි මාධ්‍ය ආරම්භක දශකයේ සිටම සමකාලීන සංහතික මාධ්‍ය න්‍යාය පිළිබඳ එක් මුල්ම පුරෝගාමියෙකු වූ නිසා ම නොව, ඔහුගේ සංහතික මාධ්‍ය න්‍යාය තුළ විශේෂයෙන් ගුවන්විදුලි මාධ්‍යයට අදාළ ව අලුත් ආකෘති සහ ප්‍රභේද ගවේෂණයෙහිලා බෙන්ජමින් දැරූ න්‍යායික සහ ප්‍රායෝගික පරිශ්‍රමය සහ ඒ හා සම්බන්ධව ගොඩනගන ලද න්‍යායික ප්‍රවේශයයි. “මාධ්‍යය ම සන්දේශය වන්නේය” යන ඉදිරිපත් කිරීමට දශක තුනකට පෙරදී බෙන්ජමින් එම අදහස ඊට වඩා පුළුල් වූ පරාසයකින් ''මාධ්‍ය යනු සන්දේශය පමණක් නොව ඍජුභාවය යි, ක්ෂණිකතාවයයි'' ප්‍රකාශ කළේ ය. බෙන්ජමින්ට අනුව භාෂා සන්දේශනයේ ඥාන විෂයීකතාව හෝ සමීපස්තභාවය ලෙස මාධ්‍ය අවබෝධ කර ගත යුතු වේ.

ගුවන්විදුලිය පිළිබඳ බෙන්ජමියානු සංකල්පීය ප්‍රවේශයේ පදනම වූයේ එහි වූ ගතික ව්‍යවහාරික ප්‍රවේශය යි. මෙහි අර්ථය වන්නේ දෛනික මිනිස් පොදු හෝ පෞද්ගලික සියලු වාසභූමි ස්ථාන ගුවන්විදුලි මාධ්‍ය මගින් ආක්‍රමණය කරන බවයි. විශේෂයෙන් ගුවන්විදුලිය මිනිසාගේ නිවහන තුළ පවා වන මුළුතැන්ගෙය, නිදන කාමරය, නාන කාමරය, විසිත්ත කාමරය ආදී සියලු පෞද්ගලික ස්ථාන වෙතට ගමන් කරන්නේ ය. සංහතික සන්නිවේදනයේ වෙනත් සන්දේශවලට වඩා ගුවන්විදුලි සන්දේශනය කෙරෙහි මහජන විශ්වාසය ප්‍රබල බව බෙන්මින් පෙන්වා දුන්නේය (Benjamin, 1932). මෙම ප්‍රවේශයේ මූලික හරය වන්නේ සන්දේශ අන්තර්ගතය නිෂ්පාදනය (සන්නිවේදකයා) සහ එය පරිභෝජනය කරන්නා (ශ්‍රාවකයා) අතර සමානාත්මක හුවමාරුවක් බෙන්ජමින්ට අනුව අලුත් මාධ්‍ය (ගුවන්විදුලිය) මහජනයා තුළ ප්‍රතිචාර ඇති වන තාක් එය සුජාත ස්වරූපයක් අත්පත් කරගත් බව කිව නොහැකි බවයි. විශේෂයෙන් ජර්මානු (ගුවන්විදුලිය) පුරෝගාමී ගුවන්විදුලි මාධ්‍යවේදයේ සම්ප්‍රවේශකයෙකු ලෙස වැඩ කරමින් පොදු සාමූහික පසුතලයක් තුළ පොදු සාමූහික (මහජන සහ ගුවන්විදුලි මාධ්‍යවේදය) අත්දැකීම් පාදකව නවාකාරයේ ගුවන්විදුලි ප්‍රභේද (ශානර) නිර්මාණය කිරීමට සුවිශාල පරිශ්‍රමයක් දරන ලදී. එම බෙන්ජමියානු ගුවන්විදුලි ශානරීය සම්ප්‍රදාය අද්‍යතනයේ දී උපරි සංහතිකකරණයට, වාණිජකරණයට, පුද්ගලානුකරණයට, අවිවේචකවාදිකරණයට, ප්‍රාථමිකකරණයට, පෘෂ්ඨීයකරණයට ලක් වී ඇති ගුවන්විදුලි සන්නිවේදකයාට විකල්පයකි.

වර්තමාන සංහතික මාධ්‍යවේදය ගුවන්විදුලි මාධ්‍යවේදය ඇතුළුව සමාජ සංස්කෘතික සහ විඥාපනික තොරතුරු ප්‍රපංචයක් ලෙස සිය පරිණාමීය ඉතිහාසයේ තීරණාත්මක අර්බුදයකට මුහුණපා ඇති බව සඳහන් කළ යුතු ය (Bourdieu, 2005). සමකාලීන සංස්කෘතිකවේදීන්ට අනුව වර්තමාන මාධ්‍යකරණය මගින් මානව සාරය විකෘතිකරණයට ලක් කරනු පෙනෙයි (Kagan, 1996). එසේම සන්නිවේදන සහ මාධ්‍ය තාක්ෂණයේ සිදු වන්නා වූ විපරිවර්තනයන් ද විශේෂයෙන් සංඛ්‍යාංකකරණය වීම සහ අන්තර්ජාලීකරණය වීම නිසා ගුවන්විදුලිය ඇතුළු නූතන සන්නිවේදනය අර්බුදයට ගොස් ඇති බව ප්‍රකටය (Russial and Wasko, 2015). සමකාලීන සංහතික සන්නිවේදන මාධ්‍ය අන්තර්ගතය ඇතුළු එහි සමස්ත හර හා වටිනාකම් පද්ධතියද සිය ඉතිහාසයෙහි ගැඹුරු අර්බුදයකට ලක් ව තිබේ. මාධ්‍යවේදයෙහි සම්භාව්‍ය ප්‍රමිති සහ තත්ත්ව පරිපූර්ණ විපරිවර්තනයකට ලක් වී ඇත. මෙය අද්‍යතන ගුවන්විදුලි මාධ්‍ය සන්නිවේදනයටද එකසේම අදාළ වන අතර, එහිදී සංහතික මාධ්‍ය ක්ෂේත්‍රයේ අභිසාරිකරණය සහ සංඛ්‍යාංකකරණය පොදු ප්‍රමිතීන් බවට පත්ව සමස්ත ගුවන් විදුලි කර්මාන්තයම ඒ ඔස්සේ වර්ධනය වෙමින් පවතී (Ala"Fossi M., Lax S, o'Neivll B, Jauert P, Shaw M, 2008).

අප ඉහත ගෙන හැර දක්වන ලද සියලු තත්ත්වයන් විමසා බැලීමේ දී අද්‍යතන ගුවන්විදුලි සන්නිවේදන පද්ධති පමණක් නොව සමස්ත සංහතික සන්නිවේදන පද්ධතියම සුවිශාල වූ පද්ධතිමය අර්බුදයකට මුහුණපා ඇති අතර, තව දුරටත් දැනට මාධ්‍ය ක්‍රියාත්මක වන්නා වූ න්‍යායන් මත ක්‍රියා කිරීම තුළින් ඊට කිසිම සාධනීය සහ යහපත් විසඳුමක් අපේක්ෂා කළ නොහැකි ය. ගුවන්විදුලියේ ප්‍රාරම්භයේදී ම අපට යෝජනා වූ බෙන්ජමියානු

මාධ්‍ය න්‍යාය" ඔස්සේ යළි කල්පනා කර බැලීම තුළ වර්තමාන මාධ්‍ය ක්‍රියා කරන න්‍යායික පද්ධතිය උන්මූලමය විපරිවර්තනයකට භාජනය කිරීම සහ කාලීන අවශ්‍යතාවක් වූව අපගේ අදහස් සංහතික ප්‍රවෘත්තිවේද සම්බන්ධව දැනට පවත්නා බහුතර න්‍යායික පද්ධති ප්‍රතිව්‍යුහකරණයකට ලක් කළ යුතු බව ස්ටීන්සන් සහ ආව පෙන්වා දුන්හ (Steensen S, Ahva, 2015). සංහතික ප්‍රවෘත්තිකරණය (Mass Journalism) භාවිතයක් ලෙස සලකා බැලීමේදී එය අත්කිසිවක් නොව ලෝකයට සරිලන්නා වූ සමාජමය ලෙස වැදගත් අර්ථ සක්‍රියකාරක මෙහෙයුමකි. මේ අනුව ප්‍රවෘත්තිකාරකගේ (Journalist) ක්‍රියාකාරීත්වයේ කේන්ද්‍රීය ලක්ෂය විය යුත්තේ තොරතුරු සහ ප්‍රජාවට වැදගත්වන දැනුම බව බෝර්ඩන් පෙන්වා දෙන්නේය (Borden, 2007). එසේම සමාජයට අවශ්‍ය කරන අවබෝධය ඇති කිරීම ප්‍රවෘත්තිකාරකගේ මූලික කාර්ය විය යුතුය (Korokonsenko, 2010). මෙය ලුමාන්ට අනුව සංහතිකයන් තුළ අනුභූතිඋත්තර මායා (Transcendental illusion) ඇති කිරීමේ සංහතික මාධ්‍යවේදාත්මක භාවිතය සමග සම්බන්ධය (Luhmann, 2001). මේ අනුව පර්යේෂකයන්ගේ සමස්ත අදහස වන්නේ සමකාලීන ගුවන්විදුලි සන්නිවේදනය ඇතුළු සමස්ත සංහතික සන්නිවේදන මාධ්‍ය පද්ධතිය සහ එහි හර පද්ධතිය මුහුණපා ඇති ගැඹුරු අර්බුදයෙන් මිදීමට නම් සංහතික මාධ්‍ය මගින් මහජනතාවට සමාජමය වැදගත්කම් සහිත අර්ථ සන්නිවේදනයක් සිදු විය යුතු බවයි.

ගුවන්විදුලිය මූලික වශයෙන් අවකාශකෘත ප්‍රවාහී විද්‍යාපන මාධ්‍යයක් වන අතර, ඒ නිසා එහි පදනම් ස්වභාවය වන්නේ සිද්ධි සජීවීව වාර්තා කිරීම වේ. ප්‍රවාහය සංජානනය කිරීමේ ක්‍රියාවලියෙහි හරය ලෙස ඉදිරිපත් වන්නේ සජීවී ධ්වනික සිද්ධි (Sonic Experiencce) වන අතර ඒ සෑම එකක් ම අර්ථජනිත ධ්වනිත අවකාශයක් ලෙස සැලකිය හැකිය (Ferington, 1994, Beer, 2007). එනම් සිනමාව ඇතුළු දෘශ්‍ය මාධ්‍යයේදී එය Mise en Scene වලට සමාන වේ. මෙම අර්ථජනිත ධ්වනිත අවකාශය වන "ධ්වනික දර්ශනය" (Soundscape) ශ්‍රාවකයාගේ දෛනික අත්දැකීම් සමඟ සම්බන්ධ වන ස්ථානීය සංවේදීතාව ගොඩ නගනු ලබයි.

මේ ආකාරයට ගුවන්විදුලි ප්‍රවෘත්තිකරණය මූලික දෛනික චර්යාත්මක ආකෘති හතරක් ඔස්සේ හැසිරෙන බව ප්‍රකාශ කළ හැකිය.

1. පුවත්පත් පාඨනයේ ආකෘතිය
2. සංකල්පිය ශ්‍රවණයේ ආකෘතිය
3. නාට්‍යයික සංවේදන ආකෘතිය
4. සමාගම් සන්නිවේදන ආකෘතිය

මේ ගුවන්විදුලි සංහතික ප්‍රවෘත්තිකරණය (මාධ්‍යවේදියා සමග සම්බන්ධ සෑම ආකෘතියක් තුළ ම ගුවන්විදුලි මාධ්‍යකරණයට අදාළ එකම ආකාරයේ මෙවලම් විවිධ සංශ්ලේෂණ සහ සංයෝජන ඔස්සේ භාවිතයට ගැනේ. කතාව සහ ගායනය ද, සංගීතය සහ නිශ්ශබ්දතාව ද, අන්තර්ඝෝෂ සහ අන්තඃප්‍රකීර්ණතා ද විශේෂ ප්‍රයෝග සහ සැබෑ සහ තථ්‍යාසන්න ධ්වනි රූපක ද ඒ අතර වේ.

වර්තමාන ගුවන්විදුලි සන්නිවේදන මාධ්‍ය තුළ පැහැදිලිව ප්‍රකට වන ගැටලු කිහිපයක් වේ. ඒ අතර කැපී පෙනෙන මූලික ම ගැටලුව වන්නේ ගුවන්විදුලි මාධ්‍ය සන්නිවේදනයට අදාළ හෝ පාදක තාක්ෂණය සහ තාක්ෂණවේදී ක්‍රමවේද කොපමණ වර්ධනය වුවද ගුවන්විදුලි මාධ්‍ය සන්නිවේදනයෙහිලා කිසිම ගුණාත්මක වර්ධනයක් පෙන්නුම් නොකිරීම පමණක් නොව, පෙර පැවැති ගුවන්විදුලි වැඩසටහන්වල ගුණාත්මකභාවය සහ ඒවායේ සන්නිවේදනීය වැදගත්කම අර්ථ හීනව් යාමයි.

තවත් වැදගත් අනිශ්චියක් වන්නේ ගුවන්විදුලි සන්නිවේදනයේ හෝ ගුවන්විදුලි මාධ්‍යකරණයේ යථාර්ථවාදී, සත්‍යවාදීභාවයේ ඉතා වැදගත් ම සාධකයක් වන එහි වාර්තාමය විශ්වාසනීයත්වය අහිමි කර ගැනීමේ ගැටලුව බරපතළ ලෙස මතුවී තිබේ- මෙම ගැටලුවේ ස්වරූපය වෙනත් වචනවලින් ප්‍රකාශ කරතොත් එය ගුවන්විදුලි මාධ්‍යකරණය සහ ව්‍යාජසංසිද්ධීත්වය පිළිබඳ ගැටලුව ලෙස ප්‍රකාශ කළ හැකිය. මෙම ගැටලුව එක් අතකින් සමාජයේ පවතින ගුවන්විදුලි මාධ්‍ය ඇතුළු සංහතික මාධ්‍ය පාලනය කරන අයිතිකාරීත්වය සමගද අනෙක් අතින් ගුවන්විදුලි මාධ්‍ය සම්භාව්‍ය ශ්‍රවණ භාවිතයන්ගේ උන්මූලමය බිඳ වැටීම සමගද සම්බන්ධ බව

අවධාරණය කළ යුතුය. මේ තත්ත්වයට හේතු වී ඇත්තේ, විශේෂයෙන් තරුණ ජනයා අතර බහුලව ප්‍රචලිතව ඇති පසුබිම් ශ්‍රවණ (Background Hearing) සංගීතය, ඩිජිටල් ප්‍රස්තුත ගුවන්විදුලි නාට්‍ය ආදිය ඇසීම සඳහා කන්පොලු (Earphone) භාවිතය නිසා ඒවා පරිසර සංජානනය නැව සේවන්නා වූ අසාමාන්‍ය පෙරහනක් බවට පත් වන්නේය. එය ඩිජිටල් ධ්වනිත තලය (Sound Landscape) පෞද්ගලීකරණය වීම දක්වා ගමන් කළ හැකිය (Emmerson,1994, Bull, 2000, Frith Ahen 2015). මෙහි ප්‍රතිඵලයක් ලෙස ඩිජිටල් අර්ථකතන අවකාශය හා සම්බන්ධ වන දෛනික සමාජ අවස්ථාවන්හි ගතික ප්‍රවණතා හඳුනා ගන්නට හෝ ප්‍රජානනය කර ගැනීමට ඇති ශක්‍යතාව නැති කර ගන්නේය.

ව්‍යාජ සංසිද්ධිත්වය පිළිබඳ දෙවැනි පැතිකඩ ගුවන්විදුලි වැඩසටහන් සංස්කරණය හා සමෝධානය පිළිබඳ වූ සම්භාව්‍ය හෝ සාම්ප්‍රදායික විග්‍රහාත්මක ආධිපත්‍ය නව තාක්ෂණික සහ තාක්ෂණවේදී විධික්‍රම හේතු කොට ගෙන බිඳ වැටීම දක්විය හැකිය "මමම ඒක කරන්න" (Do it Your Self) දාර්ශනිකවාදය සහ සංඛ්‍යාංක ශ්‍රව්‍ය වැඩස්ථාන (Digital Audio Workstation) නිදර්ශන ලෙස ගෙන හැර දක්විය හැකි අතර මේ තත්ත්වය තුළ සංගීත මාධ්‍යවේදයේ පෙර පැවැති සම්භාව්‍යය, ගුණාත්මක, ප්‍රමිතිගත, නිර්මාණාත්මක, මානවවාදී ස්වරූපය සම්පූර්ණයෙන් වෙනස් වන අතර සංගීත මාධ්‍යවේදය ස්වයංක්‍රීය, යාන්ත්‍රික, තාක්ෂණික, සරලීය සහ ප්‍රාථමික ක්‍රියාවලියක් බවට පත්ව එම වෘත්තියේ වෘත්තිකභාවය, අනන්‍යතාව, සුජාතභාවය නැති වී යන්නේ ය.

21 වැනි සියවසේ ආරම්භයේදී සංගීත මාධ්‍යවේදයට මුහුණ දීමට සිදු වී ඇති තවත් ප්‍රබලම අභියෝගයක්, ගැටලුවක් වන්නේ පසුගිය වසර 400 ක කාලය තුළ වර්ධනය වූ සංගීත මාධ්‍ය, මෙම ගුවන්විදුලි මාධ්‍යයට අදාළ පසුගිය දශක අටක පමණ කාලයක සංගීත මාධ්‍ය පද්ධතියේ ස්වභාවය, ක්‍රියාකාරිත්වය සහ සංවිධානය පිළිබඳ ආධිපත්‍ය දරන සුසමාදර්ශය උන්මූලනය ලෙස විකෘතිවීමකට ලක් විමයි.

ගුවන්විදුලි සන්නිවේදන මාධ්‍ය ඇතුළු සමස්ත සංගීත මාධ්‍ය පද්ධතිය සර්ව පැතිකඩ ම අභිසාරීකාකරණයට, සංඛ්‍යාංකකරණයට, ගෝලීයකරණයට, ප්‍රජාතන්ත්‍රීයකරණයට, නිර්සංගීතකරණයට, අර්ථශූන්‍යකරණයට, අසන්නිවේදනීකරණයට, වානිජකරණයට, තථ්‍යාසන්න යථාර්ථකරණයට ලක්වීම සමකාලීන මානව වර්ගයාගේ දැනුම, තොරතුරු සහ විද්‍යාපනික අවකාශය තුළ නිපුණු ප්‍රලයමය තත්ත්වයක් උද්ගත කොට ඇත. අද්‍යතන ශ්‍රී ලාංකේය ගුවන්විදුලි මාධ්‍යකරණය තුළද මේ තත්ත්වය ඉතා ප්‍රබල ලෙස දක්ක හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


Fluer L. De (1970), Theories of Mass Communications Sec.ed. - New York.

Benjamin W. (1932) Oesammelte Schrilten - Berlin

Bourdieu .P. (2005) Forms of Capital // Economics Sociology V.6 No 3

Kagan M.S.(1996) Philosophy of Culture St. Petersburg

Korkonosenko S.G. (2010) Theory of Journalism, Logos, Moscow.

Ala-Fossi M., Lax S., O'Neill B., Jauert P., Shaw H. (2208) The Future of Radio is still Digital – But which one? Expert perspectives and Future Scenarios for Radio Media in 2015, Journal of Radio and Auto media 15 (1).

Beer D, (2007) Tune out: Music, Soundscape and the urban mise-en-scene. Information, Communication and Society 10 (6).

Borden S.L. (2007) Journalism as practice: Macintyre, Virtue ethics and the press, Alder shot: Ashgate publishing.

Bull M. (2000) sounding out the city: personal stereos and the Management of everyday life, Oxford: Berg.

Emmerson S. (1994), "Live" versus "real-time", Contemporary music review 10 (2).

Ferrington G. (1994), Autio design: Creating multi-sensory images for the mind. Journal of Visual Literacy 14 (1).

Frith J. Ahern K.F. (2015). Make a Sound garden grow: Exploring the new media potential of Social Soundscaping. Convergence 21 (4).

Luhmann N. (2000), The Reality of Mass Media Stanford University press.

Russial J., Lauter P., Wasko J. (2015), Journalism in Crisis Journalist – The public 22 (4).

Steensen S., Ahva L. (2015), Theories of Journalism in a Digital age. Digital Journalism 3 (1).